## කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - 2015

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2007 මැයි 08 දින එළඹී අංක 712 - එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ (අ) ප්‍රතිලාභීන්ගේ ආයතනික ධාරිතාවය හා ගනුදෙනු කුසලතා ශක්තිමත් කිරීම (ආ), කුඩා පරිමාණ තේ හා රබර් වගාකරුවන්ගේ ඉඩම් බුක්තිය වැඩිදියුණු කිරීම (ඇ), වැවිලි කරුවන්ගේ නිෂ්පාදන සඳහා වැඩිදියුණු කළ, පසු - අස්වනු හැසිරවීමේ ක්‍රම, ගබඩාකරණය, සකස් කිරීම් හා ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකරණය මගින් නිෂ්පාදන ලාභය ඉහළ නැංවීම (ඈ), ග්‍රාමීය මූල්‍යායනය හා ණය සේවාවන් සංවර්ධනය හා ව්‍යාප්ත කිරිම (ඉ), කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන්ගේ දිළිඳුකම අඩුකිරීම තහවුරු කර ගැනීමයි. ණය ගිවිසුමට අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,827.82 කට සමාන එජඩො මිලියන 29.22 ක් වන අතර ඉන් රු.මිලියන 2,954.05 කට සමාන එජඩො මිලියන 22.5 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් සැපයීමට එකඟ වී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2007 නොවැම්බර් 06 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ ව්‍යාපෘති විගණනය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) නිර්දේශයන්ට/ මාර්ගෝපදේශයන්ට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ

ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘසංජාඅ (IFAD) මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහබැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව

2015 දෙසැම්බර් 31 දක්වා වැඩසටහන විසින් ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 378.24 ක් වටිනා සිවිල් වැඩ සහ වෙනත් ස්ථාවර වත්කම්, ජංගම නොවන වත්කම් ලෙස වෙනම දක්වනු වෙනුවට වැඩසටහන් වියදම යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2014 හා 2015 වර්ෂ සඳහා වැඩසටහනේ දේපල, පිරියත හා උපකරණ පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| කෘ සං ජා අ (IFAD) | 22.55 | 2,954.05 | 350.60 | 2.24 | 304.67 | 18.76 | 2,229.21 |
| ශ්‍රී ලං ර | 3.76 | 492.56 | 49.40 | - | 32.09 | - | 181.26 |
| සහභාගීත්ව මූල්‍ය ආයතන | 1.90 | 248.90 | 15.85 | - | 21.15 | - | 106.12 |
| ප්‍රතිලාභී දායකත්වය | 1.01 | 132.31 | 30.00 | - | 43.48 | - | 176.29 |
| වෙල්ලස්ස රබර් සමාගම | - | - | - | - | - | - | 2 |
| | 29.22 | 3,827.82 | 445.85 | 2.24 | 401.39 | 18.76 | 2,694.88 |

### 3.2 භෞතික ප්‍රගතිය

ප්‍රජා සංවර්ධනය, ඉඩම් පරිභෝජනය, ග්‍රාමීය ප්‍රජාවගේ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම් ප්‍රවර්ධනය කිරීම හා ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන් සඳහා මැද රට ප්‍රදේශයේ මහනුවර, නුවරඑළිය හා කෑගල්ල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක සහ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක වැඩසටහනේ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් සැකසුම් මධ්‍යස්ථාන 30 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 23.86 ක මුදලක් වැය කර තිබූ අතර ඉන් මධ්‍යස්ථාන 12 ක ඉදිකිරීම් වැඩ 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථාන 03 ක පමණක් රබර් ෂීට් නිෂ්පාදනය ආරම්භ කර තිබුණි. රබර් නිෂ්පාදන සඳහා අඩු වෙළඳපළ මිල ගණන් හේතුවෙන් හා මහ කන්නයේ වී අස්වනු කාර්යයන් සඳහා ගොවීන්ගේ කාලය වෙන්කිරීම හේතුවෙන් රබර් සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව අසතුටුදායක තත්ත්වයක පැවතුණි.

(ආ) 2016 මාර්තු මාසයේදී විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී පානීය ජලය සැපයීම සඳහා රු.මිලියන 2.44 ක පිරිවැයකට මොණරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද ළිං 12 ක් එම ජලය පානය කිරීම සඳහා නුසුදුසු තත්ත්වයක පැවතීම හේතුවෙන් අරමුණු කළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණු බව අනාවරණය විය.

(ඇ) 2013 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක කුඩා රබර් වතු හිමියන් සඳහා සහනාධාර ලබා දීමේ වැඩසටහන 2015 දෙසැම්බර් 31 දක්වා සිදු කෙරෙමින් පැවති අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 499.06 ක්වූ සහනාධාර ලබා දී තිබුණි. දේශගුණික වෙනස්වීම් හා වියළි කාලයේදී සිදු වූ ගිනි ගැනීම් හේතුවෙන් කුඩා රබර් වතු හිමියන් 323 දෙනෙකුට අයත් ඉඩම් අක්කර 435 ක නව වගා කිරීම් සාර්ථක වී නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ සඳහා රු.මිලියන 15.72 ක සහනාධාර ලබා දී තිබුණි.

(ඈ) වැඩසටහනේ ග්‍රාමීය මූල්‍යායනය හා ණය සංරචකය යටතේ ආදායම් උත්පාදන කාර්යයන් වෙනුවෙන් ග්‍රාමීය ප්‍රජාව සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. මැදරට ප්‍රදේශයේ සහභාගීත්ව මූල්‍ය ආයතන 06 ක් විසින් 2015 දෙසැම්බර් 31 දිනට උප ණය 158 ක් යටතේ සලසන ලද රු.මිලියන 140.11 ක් වූ මුළු ණය වියපැහැදමෙන්, එක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් රු.මිලියන 63.98 ක වියපැහැදමක් උප ණය 87 ක් යටතේ ලබා දී තිබුණි. ඊට අමතරව, 2015 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබූ මුළු උප ණය 158 න් උප ණය 140 ක් රජය සතු බලපත්‍රලාභී බැංකු විසින් ලබා දී තිබූ අතර ඉන් පෙනීයන්නේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික අංශයේ බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රමුඛතා ලබා දී නොතිබුණු බවයි. තවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය යෝජනා ක්‍රමය පරිපාලනය කරන බවත් වැඩසටහනේ අරමුණු කළ ප්‍රතිලාභීන් සඳහා උප ණය ලබා දී තිබුණේද යන්න තහවුරු කරගැනීම සඳහා වැඩසටහන විසින් විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඉ) තේ කම්හල් නවීකරණය සඳහා වැඩසටහන විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමය යටතේ කොත්මලේ තේ කම්හලකට වෙන්කරන ලද රු.මිලියන 7.5 ක සහනදායී ණය මුදලෙන් රු.මිලියන 4.3 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර අපේක්ෂිත පුනරුත්ථාපන වැඩ පසුව අත්හැර දමා තිබුණි.

(ඊ) මධ්‍යම පළාතේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 54 ක හා සබරගමුව පළාතේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 15 ක ප්‍රජා ව්‍යවසායක කණ්ඩායම් 243 ක් හා ඉතිරිකිරීම් හා ණයදීම් කණ්ඩායම් 248 ක් වැඩසටහන විසින් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද එවැනි ප්‍රජා සංවිධානවල මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක. වැඩසටහනේ 2015 වාර්ෂික වාර්තාව අනුව, ප්‍රජා ව්‍යවසායක කණ්ඩායම් 37 ක් හා ඉතිරි කිරීම් හා ණයදීම් කණ්ඩායම් 27 ක් ස්වාධීන විගණනයකට භාජනය වී තිබූ අතර ඉන් ප්‍රජා ව්‍යවසායක කණ්ඩායම් 19 ක් සහ ඉතිරිකිරීම් හා ණයදීම් කණ්ඩායම් 14 ක් පමණක් ඔවුන්ගේ මෙහෙයුම්වල අඛණ්ඩ පැවැත්ම තහවුරු කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනයනය කරන ලද දෙමුහුන් බඩඉරිඟු බීජ (hybrid maize seeds) මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවීන්ට බෙදා දීම සඳහා මොණරාගල ව්‍යාපෘති උප කාර්යාලය කටයුතු කර තිබූ අතර ඒ සඳහා බීජ වර්ග දෙකක් ප්‍රසම්පාදනය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව

නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද සමස්ත අවශ්‍යතාවය වූ කිලෝග්‍රෑම් 3500 ක බීජ ඉහළ පිරිවැයට මිල ගණන් ඉදිරිපත් කරන ලද SA 501 වර්ගයේ බීජ වලින් රු.මිලියන 3.39 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබූ අතර, BISI 222 අඩු පිරිවැය වර්ගයෙන් බීජ ප්‍රසම්පාදනය කර නොතිබුණි.

(ආ) මොණරාගල දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ ස්වාරක්ෂක කලාපය සලකුණු කිරීම සඳහා වැඩසටහන විසින් ක්‍රියාත්මක කර තිබූ කාර්යයන් මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 1 ක අත්තිකාරම් මුදා හැර තිබුණද, ස්ථාපිත කිරීම සඳහා අපේක්ෂා කර තිබූ මායිම් කණු 1500 කින් 2015 දෙසැම්බර් 31 දිනට මායිම් කණු 345 ක් සවිකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මොණරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය රබර් සංසඳ ශක්තිමත් කිරීම මඟින් ස්වයං රැකියා සඳහා එක් පුද්ගලයෙකුට රු.50,000 දක්වා ප්‍රදාන සැපයීමට ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවක් රු.මිලියන 2.43 ක පිරිවැයකට පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභීන් 120 දෙනෙකුට එකතුව රු.මිලියන 5.82 ක ප්‍රදාන මුදා හැර තිබුණි. එයින් පෙනී යන්නේ ප්‍රදාන සඳහා පරිපාලන පිරිවැය සියයට 41.6 ක් වූ ඉතා ඉහළ ප්‍රමාණයක් බවයි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව, සේවා සපයන සමාගම මැදිහත් වූයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පමණක් නොව ග්‍රාමීය රබර් සංසඳ, ව්‍යවසායකයින් හා වෙළඳ සංවිධාන ශක්තිමත් කිරීමට හා අනාගත වෙළඳපොල අවස්ථා සොයා ගැනීමටද කටයුතු කළ බවයි.

### 3.4 මූල්‍ය පාලනයට අදාළ ගැටලු

මොණරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව වැඩසටහනේ උප කාර්යාලයෙන් සහනාධාර ලබා දීම පිළිබඳ මූල්‍ය පාලනයන් සතුටුදායක නොවූ බව නිරීක්ෂණය විය. වැඩසටහන සඳහා සහනාධාර වාරික ගෙවීම් කටයුතු මෙහෙයවීම සඳහා වගකීම දැරූ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයාම දෙපාර්තමේන්තුවේ මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙසද කටයුතු කර තිබුණු අතර වැඩසටහන් උප කාර්යාලය විසින් කරන ලද සහනාධාර ගෙවීම් සඳහා සහතික කිරීමේ නිලධාරීයා ලෙසද කටයුතු කර තිබුණි.

### 3.5 නිෂ්කාර්ය/ ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රදේශයේ කෘෂිකාර්මික නිෂ්පාදන විකිණීම සඳහා රු.මිලියන 1.52 පිරිවැයකට මදුරුකැටිය හි ඉදිකරන ලද ගොඩනැගිල්ලේ කඩකාමර 03 කින් කඩ කාමර 02 ක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ආ) රබර් සැකසුම් මධ්‍යස්ථාන 27 ක ප්‍රයෝජනය සඳහා මොණරාගල වැඩසටහන් කාර්යාලය විසින් රු.මිලියන 4.55 ක පිරිවැයකට 2014 වර්ෂයේදී ප්‍රසම්පාදනය කරන ලද උපකරණ වර්ෂයකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) රු.මිලියන 4.60 ක පිරිවැයකට 2011 ජුලි 05 දින ප්‍රසම්පාදනය කරන ලද වාහනය 2011 නොවැම්බර් 19 දින අනතුරකට භාජනය වූ අතර පසුව එය ගර්හිත කර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පරිශ්‍රයේ තබා තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂට අනුව, රියදුරු නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම හේතුවෙන් අනතුර සිදු වී තිබීම නිසා ඒ සඳහා ඉල්ලුම් කරන ලද රක්ෂණ වන්දි මුදල් අහරු කර තිබුණි.